අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறியீடு / My Ref. PTF/01/Circular/01

ඔබේ යොමුව / உமது குறியீடு / Your Ref.

දිනය / திகதி / Date 2021.05.31

චක්‍රලේඛ අංකය : PTF/03-2021 (i)

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

කොවිඩ් - 19 ව්‍යසනකාරී තත්ත්වය නිසා බලපෑමට ලක්වූ පවුල්වලට රු.5,000/=ක දීමනාවක් ගෙවීම

කොවිඩ් - 19 ව්‍යසනයේ තෙවන ව්‍යාප්තිය නිසා බලපෑමට ලක්වූ පවුල්වලට රු.5,000/=ක් වන සේ දීමනාවක් ගෙවීමට රජය තීරණය කර ඇත.

02. මෙහිදී, මා විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක PTF/03-2020, PTF/03/2020 (i), PTF/03/2020 (ii), PTF/03/2020 (iii) හා PTF/03/2020 (iv) මඟින් හඳුනාගෙන, මේ වන විට සුදුසුකම් ලබන පවුල් මෙම දීමනාව ලැබීමට මූලිකව හිමිකම් ලබයි.

03. ඉහත සඳහන් චක්‍රලේඛ මඟින් හඳුනා නොගත්, මේ අවස්ථාවේ දී රු. 5,000/= දීමනාව ලබා ගැනීමට ඉල්ලුම් කරන යම් පවුලක්, චක්‍රලේඛ අංක PTF/03/2020 (ii) හි සඳහන් පෝරමය පුරවා ග්‍රාමීය කමිටුවේ යම් සාමාජිකයෙකුට භාරදිය හැකිය. එවිට, ග්‍රාමීය කමිටු නිර්දේශය මත ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් මෙම දීමනාව ගෙවීමට සුදුසු නව පවුලක් ලෙස හඳුනාගත හැකිය.

04. ඡන්ද හිමි නාම ලේඛනයේ එක් ගෘහ මූලික අංකයක් යටතේ ලියාපදිංචි වී සිටිය ද, එම ගෘහ මූලික අංකයේ ප්‍රධාන පවුලට අමතරව, එක් අනු පවුලක් හෝ ඊට වැඩි ගණනක් සිටී නම්, ඔවුන්ව චක්‍රලේඛ අංක PTF/03/2020 (iv) මඟින් හඳුනාගෙන ඇති බැවින්, එම අනු පවුල්වලට ද මෙම දීමනාව හිමි වේ. එම චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසුව අනු පවුල් වලට බෙදී ඇති විට, ඒ සම්බන්ධව අවසාන තීරණය ප්‍රාදේශීය ලේකම් විසින් ගත යුතුය.

05. **රු.5,000/= දීමනාව හිමිවන පවුල් වර්ගීකරණය**

5.1 ඌණ පූර්ණය ගෙවීම මත රු.5,000/=ක් හිමිවන පවුල්

මධ්‍යම රජයෙන් පවුල්වලට දැනට ගෙවනු ලබන වැඩිහිටි දීමනාව, ගොවි විශ්‍රාම වැටුප්, ධීවර විශ්‍රාම වැටුප් හා සමෘද්ධි සහනාධාර දීමනාව රු.5,000/=ක් වන සේ ඉතිරි මුදල් ප්‍රමාණය පමණක් ගෙවනු ලැබේ. ඒ අනුව, එක්වර රු.5,000/=ක් ප්‍රතිලාභියාට ලැබෙනු ඇත. ඉහත සඳහන් දීමනා කිහිපයක් යම් පවුලකට ගෙවනු ලබයි නම්, රු.5,000/= දීමනාවේ ඌණ පූර්ණය ගෙවීම සඳහා පදනම් කර ගත යුත්තේ උපරිම මූල්‍යමය අගය සහිත දීමනාව වේ.

5.2 සානුකම්පිත දීමනාව හිමිවන පවුල්

යම් පවුලකට මධ්‍යම රජයෙන් ගෙවනු ලබන අනෙකුත් දීමනාවන් නොලැබී, සියවස් පූර්ණ වැඩිහිටි දීමනාව හෝ ආබාධිත දීමනාව හෝ වකුගඩු දීමනාව යන රු.5,000/= දීමනාවන්ගෙන් එක් දීමනාවක් පමණක් දැනට ලැබෙන විට, ඔවුන්ට පමණක් සුවිශේෂී වන සේ රු. 3,000/=ක සානුකම්පිත දීමනාවක් ගෙවනු ලැබේ.

5.3 රු.5,000/= දීමනාව සම්පූර්ණයෙන් ම හිමිවන පවුල්

5.3.1 සමෘද්ධි දීමනාව ලැබීමට සුදුසුකම් සහිතව ලේඛනගත කර ඇති අඩු ආදායම්ලාභී පවුල්

5.3.2 ජීවනෝපාය අහිමි වීම මත තෝරා ගෙන ඇති පවුල්

5.3.3 මුල් අවස්ථාවේ දී ග්‍රාමීය කමිටුවේ නිර්දේශ මත හෝ අදාළ මහලේකම් කාර්යාලවල පොරොත්තු ලේඛනවල වැඩිහිටි, ආබාධිත හා වකුගඩු දීමනා ලැබීමට සුදුසුකම් සහිතව ලේඛනගත කර ඇති පවුල්

5.3.4 අභියාචනාවලින් තෝරා ගෙන ඇති පවුල්

5.3.5 රජයෙන් කිසිදු දීමනාවක් නොලබන හා නොමිලේ සේවා සපයන ආගමික ස්ථාන, වැඩිහිටි නිවාස, ළමා නිවාස හා ආබාධිත නිවාස වැනි සුභසාධක ස්ථානවල නේවාසිකයින් හතර දෙනෙකු එක් පවුලක් සේ සලකා ග්‍රාමීය කමිටුවේ නිර්දේශ මත තෝරාගනු ලබන ප්‍රතිලාභී ඒකක

5.3.6 මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන උපයෝගී කර ගෙන මේ අවස්ථාවේ දී අයදුම්පත් ඉදිරිපත් කර, ග්‍රාමීය කමිටුවේ නිර්දේශ මත තෝරා ගනු ලබන පවුල්

06. මෙම සම්පූර්ණ ගෙවීම් ක්‍රියාවලියේදී ම තෝරාගත් පවුලකට හිමිවන්නේ එක් රු.5,000/=ක දීමනාව හෝ සානුකම්පිත දීමනාව හෝ පමණි. ඉහත සඳහන් **5.3** ඡේදයේ **5.3.1, 5.3.2, 5.3.3** සහ **5.3.4** අනු ඡේද යටතේ මුල් අවස්ථාවේ දී තෝරා ගත් පවුල් පිළිබඳව ග්‍රාමීය කමිටුව විසින් නැවත පුළුල් සමාලෝචනයක් සිදු කර, කමිටු නිර්දේශ ප්‍රාදේශීය ලේකම්ට ලබා දී, ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය මත ගෙවීම් සිදු කළ හැකිය. තවද, **5.3.2 , 5.3.4** හා **5.3.6** අනු ඡේද යටතේ පවුල් තෝරා ගැනීමේ දී, සංචරණ සීමා පනවා ඇති කාලය තුළ දී ආදායම් උත්පාදන කටයුතුවල නිරත වීමට ලබා දී ඇති අවස්ථාවන් ද සැලකිල්ලට ගැනීම යෝග්‍ය වේ.

07. අංක PTF/03/2020 (ii) හා 2020.04.15 දිනැති චක්‍රලේඛයේ **ඇමුණුම - 01**හි කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කර ඇති ආකෘති පත්‍රයට ගැලපෙන ආකාරයට ප්‍රතිලාභියා රු.5,000/= දීමනාව හෝ සානුකම්පිත දීමනාව ලබාගත් බවට සහතිකයක් ලබාගැනීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

08. මේ සමඟ අමුණා ඇති වගුවේ සඳහන් ආකාරයට දීමනා ගෙවීම වර්ගීකරණය කර ගන්නා ලෙසත්, එම වර්ගීකරණයට අනුව ගෙවීමේ ප්‍රගතිය දිස්ත්‍රික් ලේකම් විසින් ජනාධිපති කාර්යසාධන බලකාය වෙත වාර්තා කරන ලෙසත් කාරුණිකව ඉල්ලමි.

ගාමිණී එස්. සෙනරත්
අග්‍රාමාත්‍ය ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. විගණකාධිපති

} කාරුණික දැන ගැනීම සඳහා

4. ලේකම්, මුදල් අමාත්‍යාංශය
5. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
6. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
7. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
8. ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
9. ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
10. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
11. ලේකම්, ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
12. ලේකම්, පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
13. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
14. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
15. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
16. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
17. අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව
18. අධ්‍යක්ෂ, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
19. අධ්‍යක්ෂ, ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ මහලේකම් කාර්යාලය

} අවශ්‍ය කටයුතු සඳහා

චක්‍රලේඛය පිළිබඳ වැඩිදුර පැහැදිලි කර ගැනීම්	-	කේ.ප්‍රසන්න චන්දිත් මහතා ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකාරක ජනාධිපති කාර්යසාධන බලකාය 077 36 415 63

ඇමුණුම

කොවිඩ් - 19 ව්‍යසනකාරී තෙවන ව්‍යාප්තිය නිසා
බලපෑමට ලක්වූ පවුල් වලට රු.5,000/=ක දීමනාව ගෙවීම

දිස්ත්‍රික්කය : දිනය:

#	දීමනාලාභී පවුල්	ගෙවීම් කරන ලද පවුල් සංඛ්‍යාව	වැය වූ මුදල
ඌණ පූර්ණය ගෙවීම මත රු. 5,000/=ක් හිමිවන පවුල්			
1.	වැඩිහිටි දීමනාලාභී පවුල්		
2.	සමෘද්ධි ප්‍රතිලාභී පවුල්		
	2.1 රු.420/=		
	2.2 රු.1,500/=		
	2.3 රු.2,500/=		
	2.4 රු.3,500/=		
3.	ගොවි විශ්‍රාම වැටුප් ලබන පවුල්		
4.	ධීවර විශ්‍රාම වැටුප් ලබන පවුල්		
	උප එකතුව		
සානුකම්පිත දීමනාව හිමිවන පවුල්			
5.	සියවස් පූර්ණ වැඩිහිටි දීමනාලාභී පවුල්		
6.	ආබාධිත දීමනාලාභී පවුල්		
7.	වකුගඩු දීමනාලාභී පවුල්		
	උප එකතුව		
රු.5,000/=දීමනාව සම්පූර්ණයෙන් ම හිමිවන පවුල්			
පූර්ව චක්‍රලේඛ ප්‍රතිපාදන යටතේ			
8.	සමෘද්ධි දීමනාව ලැබීමට සුදුසුකම් සහිතව ලේඛනගත කර ඇති අඩු ආදායම්ලාභී පවුල්		
9.	ජීවනෝපාය අහිමි වීම මත තෝරා ගෙන ඇති පවුල්		
10.	මුල් අවස්ථාවේ දී ග්‍රාමීය කමිටුවේ නිර්දේශ මත හෝ අදාළ මහලේකම් කාර්යාලවල පොරොත්තු ලේඛනවල වැඩිහිටි, ආබාධිත හා වකුගඩු දීමනා ලැබීමට සුදුසුකම් සහිතව ලේඛනගත කර ඇති පවුල්		
11.	අභියාචනාවලින් තෝරා ගෙන ඇති පවුල්		
	උප එකතුව		
මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන යටතේ			
12.	රජයෙන් කිසිදු දීමනාවක් නොලබන හා නොමිලේ සේවා සපයන සුභසාධක ස්ථානවල ප්‍රතිලාභී ඒකක		
13.	මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන උපයෝගී කර ගෙන අයදුම්පත් ඉදිරිපත් කර, ග්‍රාමීය කමිටුවේ නිර්දේශ මත තෝරා ගනු ලබන පවුල්		
	උප එකතුව		
	මුළු එකතුව		

ඇමුණුම - 01

රටේ උද්ගත වී ඇති තත්ත්වය අනුව ජීවනෝපාය අහිමිවීම මත රජයෙන් ලබාදෙනු ලබන රු.5,000/=දීමනාව ලබා ගැනීම සඳහා අයදුම් පත්‍රය

1. ගෘහ මූලිකයාගේ නම : .....
2. පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව : .....
3. ජාතික හැඳුනුම්පත් අංකය : .....
4. උපන් දිනය : .....
5. ස්ථිර පදිංචි ලිපිනය : .....
6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .....
7. ග්‍රාම නිලධාරී වසම : .....
8. ගෘහ මූලික අංකය : .....
9. කරන ලද රැකියාව : .....
10. එම රැකියාව සම්බන්ධයෙන් ලියාපදිංචියක් සිදුකර ඇත්නම්, ලියාපදංචි අංකය : .....
11. ලියාපදිංචි කරන ලද ආයතනය : .....
12. රජයෙන් රු.5,000/= දීමනාව ඉල්ලීමට හේතුව :

.....

.....

.....

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

....

දිනය අයදුම්කරුගේ අත්සන

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

..... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ..... ග්‍රාම නිලධාරී වසමේ පදිංචි ..... වන මම, ... දින කොරෝනා වෛරසය පැතිරයාම හේතුවෙන් සංචරණ සීමා පැනවීම නිසා ජීවනෝපාය අහිමි වූ පවුල් ඒකකයක් සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි රජය මඟින් ලබා දෙන රු. 5,000/=ක දීමනාව ලබා ගත් බව මෙයින් සහතික කරමි.

.....

භාර ගත් බවට අයදුම්කරුගේ අත්සන

සාක්ෂි:

01. ග්‍රාම නිලධාරී නම : ..... අත්සන : .....

02. සමෘද්ධි සංවර්ධන නිලධාරී නම : ..... අත්සන : .....

දිනය : .....